## 26

# (1) සාහිත්‍ය විචාරය නිශ්චිත විධි ක්‍රමයක සිරගත කළ යුතු ද?
# (2) විචාරයේ කේන්ද්‍රය නිර්මාණයයි.

*මනෝජ් ප්‍රසන්න රත්නායක*

සාහිත්‍ය විචාරය සම්බන්ධයෙන් ඉදිරිපත් වී තිබෙන නිර්වචන සංඛ්‍යාව සුවිශාලය. කොතරම් සූක්ෂ්ම තලයක මේ නිර්වචන ව්‍යාප්තව තිබේ ද කිවහොත් විචාරය යනුවෙන් යම් විශේෂිත වූ ප්‍රපංචයක් නොමැතිය යන මතය ද ඉදිරිපත් ව තිබේ.

ඉතා සරල ලෙස හඳුන්වනවා නම් විචාරය යනු සාහිත්‍ය කලා ක්ෂේත්‍රය පිළිබඳ සුවිශේෂ පුහුණුවක් ලද විද්‍යාර්ථීන් සාහිත්‍ය නිර්මාණ අරබයා ඉදිරිපත් කරන්නා වූ තර්කානුකූල ප්‍රකාශයන් ය. මෙවැනි විද්‍යාර්ථීන් හඳුන්වනු ලබන්නේ විචාරකයන් යනුවෙනි.

විචාරකයා සිය කාර්යය කරන්නේ කෙලෙස ද යන්න මීළඟට අවධානයට ලක්විය යුතු කරුණයි. වඩු බාස්ට හෝ මේසන් බාස්ට සිය කටයුතු සඳහා මෙවලම් මල්ලක් මෙන් ම අලිඛිත නීති පද්ධතියක් ඇත. විනිශ්චයකාරවරයාට ලිඛිත නීති පද්ධතියක් ඇති අතර ඔහුගේ මෙවලම් මල්ල වන්නේ ද එයමයි. විචාරකයාට ද මෙවලම් මල්ලක් අවශ්‍යය. ඒ න්‍යායික දැනුමයි. විචාරය පිළිබඳ න්‍යායික දැනුමෙන් තොරව විචාරයක යෙදිය නොහැකිය.

මේ න්‍යාය ඔස්සේ විවිධ විචාර විධි ක්‍රම බිහිව තිබේ. විචාරකයාට මේ විධි ක්‍රමවල පිහිට පතන්නට අනිවාර්යයෙන්ම සිදුවේ. විධික්‍රම මගින් විචාරයට දෘඪ බවක් විශ්වාසනීය බවක් හා සාටෝපවත් බවක් එක් කරයි.

එහෙත් විචාරකයා මුළු ජීවිත කාලය පුරා ම එක් විචාර සිද්ධාන්තයක් තුළ සිරව සිටීම විචාරයටත් නිර්මාණයටත් කරන්නා වූ අසාධාරණයකි. කෙසේ වෙතත් ඇතමුන්ගේ අදහස වන්නේ නිශ්චිත විචාර විධි වේදයකට අනුගත වීම උචිත බවය. එක් කෘතියක් එක් ක්‍රමයකින් ද වෙනත් කෘතියක් වෙනස් ක්‍රමයකින් ද විචාරය කිරීම අසාධාරණ බව එවැන්නන්ගේ තර්කයයි. සාහිත්‍ය විචාරයට නිශ්චිත විධි ක්‍රමයක් අවශ්‍ය ද යන මතය විවාදයට තුඩු දී පවතින්නක් බව ඉතා පැහැදිලි ය.

කීර්තිමත් සාහිත්‍ය විචාරකයකු මෙන්ම සිද්ධාන්ත වේදියකු ද වන මහාචාර්ය කුලතිලක කුමාරසිංහ විද්වතා නිශ්චිත විධි ක්‍රමයක් අනවශ්‍යය යන මතය වෙනුවෙන් දැඩිව පෙනී සිටි අයෙකි. මගේ දැනුමට අනුව



මේ වෙනුවෙන් බුද්ධිමය සංවාදයක් බිහි කිරීමට මුල්වූ පුද්ගලයා වන්නේ එතුමාම ය.

මේ පිළිබඳ සංකථනය ඇරඹියේ 2000 ජුනි 25 දා සිළුමිණ පුවත්පතෙහි සාහිත්‍ය අතිරේකයට කුලතිලක කුමාරසිංහ විද්වතා ලියූ ලිපියකිනි. ඔහුගේ ලිපියේ සිරස වූයේ "සාහිත්‍ය විචාරය උදෙසා නිශ්චිත විධි ක්‍රමයක් අවශ්‍ය ද?" යන්නයි. ඔහු සිය ලිපියෙහි මෙවැනි සඳහනක් කරයි.

> "සාහිත්‍ය විචාරකයාගේ අවධානය ප්‍රධාන වශයෙන් ම යොමු විය යුතු වන්නේ සාහිත්‍ය නිර්මාණය කෙරෙහි ය. සාහිත්‍ය නිර්මාණයෙන් පටන් ගෙන සමාජය පිළිබඳවත්, සාහිත්‍යකරුවා පිළිබඳවත් ගවේෂණය කිරීමේ නිදහස සාහිත්‍ය විචාරකයාට ඇත. මෙය පැරණි විචාර ක්‍රමවලට වඩා වෙනස් වන්නේ පැරණි විචාරකයා කෘතියෙන් පටන් නොගෙන කෘතිය හා සමාජය අතර සම්බන්ධතා මූලාශ්‍ර කොටගෙන කෘතිය වෙත එළැඹීම නිසාය. බොහෝ වර්තමාන බටහිර විචාරකයන් ප්‍රකාශ කරන ආකාරයට අනුව සාහිත්‍ය විචාරයෙහි ඉතා ස්වාභාවික වූත් ප්‍රඥාගෝචර වූත් ආරම්භක ස්ථානය වන්නේ සාහිත්‍ය නිර්මාණයම යි"
>
> (සිළුමිණ 2000 ජුනි 25)

කුමාරසිංහ විද්වතාගේ ප්‍රකාශයෙහි අවසාන වාක්‍යය වන "සාහිත්‍ය විචාරයෙහි ඉතා ස්වාභාවික වූත් ප්‍රඥාගෝචර වූත් ආරම්භක ස්ථානය වන්නේ සාහිත්‍ය නිර්මාණයමය." යන්න කෙරෙහි විශේෂ අවධානය යොමු කරන්නට කැමැත්තෙමි. මේ ප්‍රකාශයෙන් කියැවෙන දේ කුමාරසිංහ විද්වතාගේ විචාර දිවියට දැඩිව බද්ධ වී ඇතැයි අනුමාන කළ හැකිය.

කුමාරසිංහ විද්වතා සිය විශ්වවිද්‍යාලයීය දේශනවලදී මෙන්ම වෙනත් පොදු සාහිත්යික දේශනවලදී ද නිරතුරු මේ මතය ස්ඵුට කිරීමට වෙහෙසෙයි. එහෙයින් නිර්මාණ කේන්ද්‍රීය විචාර සිද්ධාන්තයේ ශ්‍රී ලාංකේය ප්‍රකාශකයා ලෙස ඔහු හැඳින්වීමේ වරදක් නැතැයි මම සිතමි. කුලතිලක කුමාරසිංහ මහාචාර්යවරයා විචාරයෙහි ආරම්භක ස්ථානය නිර්මාණය විය යුතු බව පවසන්නේ ආකස්මිකව නොව ඉතා පුළුල් පදනමක රැඳෙමින් ය.

මහාචාර්ය කුමාරසිංහගේ මේ අදහස් ඊට සාක්ෂ්‍ය සපයයි.

> "අපගේ අදහසට අනුව නම් නිර්මාණයක් විශ්ලේෂණය කිරීමට පෙළෙඹෙන විට එක් විචාර සිද්ධාන්තයක කොටු වී එයම හිසෙහි රඳවා ගෙන නිර්මාණය දෙස බැලීමෙන් එම කලා කෘතියටත් ලේඛකයාටත් සිදුවන්නේ අසාධාරණයකි. විචාරයේ ආරම්භක ස්ථානය ලෙස සැලකිය යුත්තේ නිර්මාණයයි. එබැවින් පළමුව කළ යුත්තේ නිර්මාණය අධ්‍යයනය කිරීමයි. පූර්ව නීතිරීති පද්ධතියක් හිස තබාගෙන නිර්මාණය විචාරය කොට ඒවා

කෘතියේ නොමැති කල කෘතිය ප්‍රතික්ෂේප කිරීම නිසා ලේඛකයන්ට බලවත් අසාධාරණකම් සිදුවූ අවස්ථා බොහෝය. අපි මාක්ස්වාදී විචාර කලාව ගෙන බලමු. මාක්ස්වාදී විචාරය මෙරටට හඳුන්වා දෙනු ලැබුවේ සයිමන් නවගත්තේගමගේ 'සාහිත්‍යය සමාජවාදය හා කලා විචාරය' නම් කෘතියෙනි. ඉන් අනතුරුව මහාචාර්ය සුචරිත ගම්ලත් හා පියසීලි විජේගුණසිංහ මාක්ස්වාදී විචාරයට පිළිපන්හ. මේ අතරෙන් මාක්ස්වාදී විචාරය ප්‍රායෝගික තලයකට ගෙන ගියේ මහාචාර්ය ගම්ලත් විසිනි. එහෙත් පූර්ව නීතිරීති පද්ධතියක් හිස තබාගෙන කරනු ලැබූ මේ විචාර නිසා කොතෙක් දෙනා අධෛර්යට පත්වීද?"

(සිළුමිණ. 2000 ජූනි 25)

කුමාරසිංහ පඬිවරයාගේ මේ ලිපිය සමකාලීන විචාරක අවකාශය වෙත හදිසියෙන් හෙළන ලද න්‍යෂ්ටික බෝම්බයක් විය. ඒ න්‍යෂ්ටික විචලයනයට ප්‍රතිචාර සති කීපයක් ඇතුළත දැකගත හැකිවිය. මහාචාර්ය කුමාරසිංහගේ මතය නිර්දය ලෙස විවේචනය කරමින් පුවත්පතට ලිපි ලැබෙන්නට විය. ඔහුට එරෙහිව එවූ පළමු ලිපිය 2000 අගෝස්තු හයවැනිදා සිළුමිණෙහි පළවිය. මාක්ස්වාදී කලා විචාරය බැහැර කළ හැකිද? යන මැයෙන් සමන් කාරියකරවන විසින් ලියන ලද ලිපියෙන් උත්සාහ ගෙන තිබුණේ මාක්ස්වාදී විචාර ක්‍රමය සප්‍රමාණ එකක් බව තහවුරු කිරීමය. ජනක වීරසිංහ නම් මහතකුගේ ලිපියක් ද (මේ සම්බන්ධ) ආසන්න දිනයක පළවිය. එහි අරමුණ වූයේ ද මාක්ස්වාදී විචාරය ඔසොවා තබමින් කුමාරසිංහ මහතාට අවලාද නැගීමයි.

මේ සංවාදයට සහභාගිවීමේ මහඟු භාග්‍යය මටද උදාවිය. වීරසිංහ හා කාරියකරවන මහත්වරුන්ගේ ලිපිවලට පිළිතුරු ලෙස මවිසින් ලියන ලද ලිපිය 2000 සැප්තැම්බර් 24 සිළුමිණෙහි පළවිය. ඒ ලිපියෙහි මා අවධාරණය කළේ ද එක් විචාර සිද්ධාන්තයකට සීමා වීමේ දෝෂය පිළිබඳව යි.

මගේ ලිපියට පිළිතුරක් (ජනක වීරසිංහ විසින් එවන ලද) ඊට පසු සතියක සිළුමිණෙහි පළවිය.

එහිදී වීරසිංහ මහතා නැවත නැවතත් කියා සිටියේ කුමාරසිංහයන්ගේ නිර්මාණ කේන්ද්‍රීය විචාර සිද්ධාන්තය (වීරසිංහ මේ සිද්ධාන්තය හැඳින්වූයේ සාහිත්‍ය කලා නාශක දුර්මතයක් ලෙසය) හෙළා දැකිය යුතු බවය.

විචාරයට නිශ්චිත විධි ක්‍රමයක් අවැසි ද යනුවෙන් පැන නැඟුණු මේ පුවත්පත් සංවාදය සාහිත්‍ය විචාරයට කිසියම් ආලෝක දහරාවක් සැපයූ බව අතිශයෝක්තියක් නොවේ.

කුමාරසිංහ පඬිවරයාගේ මතයට එරෙහිව තර්ක එලවන්නන්ගේ අදහස්වලට ද අපි මඳකට නෙත් යොමු කරමු. ඔවුන්ගෙන් ඇතැමකු පවසන්නේ මාක්ස්වාදී විචාරය සප්‍රමාණ මෙවලමක් නිසා වෙනත් විචාර ක්‍රම අනවශ්‍ය බවය. එය ඉතා දුර්වල තර්කයකි. මාක්ස්වාදය වර්තමාන සමාජය විස්තර කිරීමට පවා ප්‍රමාණවත් නොවන බව පශ්චාත් මාක්ස්වාදීන් විසින් පෙන්වා දෙනු ලැබ ඇත. මහාචාර්ය ෆ්‍රෙඩ්රික් ජේම්සන්, මහාචාර්ය ටෙරී ඊගල්ටන් වැනි විද්වතුන්ගේ ලේඛන වලින් මෙය තහවුරු කරන්නට පුළුවන.



මාක්ස්වාදී විචාරකයන් එම විචාරය සාර්වත්‍රික බව පවසන්නා සේම ප්‍රායෝගික විචාරකයෝ තම ක්‍රමවේදය සාර්වත්‍රික බව පවසති. සමාජ විද්‍යාත්මක විචාරය අනුගමනය කරන්නන්ගේ අදහස වන්නේ තම විධිවේදය පමණක් විශිෂ්ට බවය. මෙලෙස හැම කෙනෙක් ම තමන්ගේ විධිවේදය සප්‍රමාණ යැයි සිතති. එහෙත් එය මතිභ්‍රමයක් පමණි.

කිසිදු විධිවේදයක් සාර්වත්‍රික හෝ සර්වකාලීන හෝ නොවේ. ලොව දිනෙන් දින නවීකරණය වන්නා සේ නිර්මාණ ද අලුතෙන් බිහි වේ. නිර්මාණකරුවෝ නව ආකෘති බිහි කරති. මීට සියවසකට පෙර ජීවත්වූවකුට සිතා ගන්නට බැරි තරමට අද සමාජය වෙනස් ව තිබේ. මුද්‍රිත නවකථා මෙන්ම අද එස්.එම්.එස් නවකථා ද බිහිවේ. පුරාණ භාරත පඬිවරුන් නාට්‍ය විචාරය සඳහා යොදාගත් රස ධ්වනි සිද්ධාන්ත වර්තමාන පශ්චාත් ධනවාදී හා පශ්චාත් නූතනවාදී පාඨකයන් සඳහා ඒ අයුරින් ම යොදාගත නොහැකිය. නිර්මාණ කේන්ද්‍ර කර ගනිමින් විචාරය කළ යුතුය යන අදහස තරුණ නිර්මාණකරුවකු හා විචාරකයකු ද වන මහාචාර්ය සුසන්ත මහඋල්පත මහතා විසින් ද මෑතකදී ඉදිරිපත් කරන ලදි. ඒ ඔහු විසින් දිවයින පුවත්පතට ලියන ලද ලිපියකිනි. කුමාරසිංහ පඬිවරයා පවසන නිර්මාණ කේන්ද්‍රීය විචාරය සුසන්ත මහඋල්පත මහතා තම විචාරවලද ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරන බව පෙනෙන්නට තිබේ.

කුලතිලක කුමාරසිංහ හුදු විචාර සිද්ධාන්තවේදියකු පමණක් නොවේ. ඔහු ප්‍රායෝගිකව ම විචාරයෙහි යෙදෙන්නෙකි. එමෙන් ම නිර්මාණකරුවෙකි. ඔහු මෑත භාගයේ පළවූ නවකතා විශාල ප්‍රමාණයක් විචාරයට බඳුන් කරමින් 'අද්‍යතන සිංහල නවකතා' මැයෙන් ග්‍රන්ථ ශ්‍රේණියක් ම පළ කළේය. මෙහිදී නිර්මාණ කේන්ද්‍රීය විචාර විධිවේදයෙන් මඳකට අපගමනය වෙමින් පෞද්ගලික කරුණක් සඳහන් කරමි. (පශ්චාත් නූතනවාදී විචාරය තුළ නම් පෞද්ගලික කරුණුවලට වැදගත් තැනක් ලැබේ.)

මේ සඳහන යම් පමණකට පෞද්ගලික වුවත් එය කුමාරසිංහ පඬිවරයාගේ අපක්ෂපාතී විචාර රටාවට කදිම දෘෂ්ටාන්තයක් සපයයි. කුමාරසිංහ මහතා මා කෙරෙහි මහත් වූ ස්නේහයක් දක්වන බව මම දනිමි. කීර්තිමත් මහාචාර්යවරුන්ගේ ලිපිවලින් අලංකරණය වූ මේ උපහාර කලාපයට ලිවීමට සිංහල පිළිබඳ ප්‍රථම උපාධියක් හෝ නොමැති මා වැන්නකුට ඉඩ ලැබීම ම ඔහුගේත් සංස්කාරකවරුන්ගේත් දයාවේ සලකුණකි. එසේ වුවද ඒ පෞද්ගලික හිතවත්කම් විචාරයේ දී

නොතැකීම ඔහුගේ සිරිතයි. මවිසින් ලියන ලද "හන්දියේ සුසානයේ" නවකතාව අවර ගණයේ කෘතියක් බව ඔහු සිය 'අද්‍යතන සිංහල නවකතා - තෘතීයභාගය' ග්‍රන්ථයෙන් කියා සිටියේ මිත්‍ර සබඳතා හා විචාරය යනු එකක් නොව දෙකක් යැයි පසක් කරවමිනි. 'හන්දියේ සුසානය' එය ලියැවුණු කාලයේදී ඉතා ජනප්‍රිය වූ එමෙන් ම විචාරක ප්‍රසාදයට ද පාත්‍රවූ කෘතියකි. එහෙත් ඒ කිසිදු බාහිර කරුණක් නොතකමින් කුමාරසිංහ පඬිවරයා ඒ නිර්මාණය ගැන සිය අවංක අදහස් පළ කළේය. මෑතදී මා ලියූ 'මෙහිම්නි නැත්නුරා' පිළිබඳ සිළුමිණ පුවත්පතට විචාරයක් ලියමින් කුමාරසිංහ මහතා සඳහන් කළේ එය අපරිණත අත්හදා බැලීමක් බවයි.

ඔහු ගැන මනා වැටහීමක් නැති කෙනෙකුට නම් ඔහු හා අමනාප වන්නට එම විචාරය ම ප්‍රමාණවත් ය. ඔහුගේ විචාරය කියවා බැලූ පළමු අවස්ථාවේ මා තුළ ද සියුම් කෝපයක් ඇති විය. එහෙත් දෙවනුව මට හැඟී ගියේ සිංහල සාහිත්‍ය විචාර ක්ෂේත්‍රයේ සූර්යයා බඳුවූ ඔහු අතින් මගේ කෘතියක් විචාරයට බඳුන් වීමත් ගෞරවයක් නොවේද යන්නයි.

පසුදිනක ඔහුගේ පීඨාධිපති කාර්යාලයේ දී හමුවූ වෙලාවෙහි ඔහු මට මෙසේ කීවේය. "අමනාප වෙන්න එපා. පොත අගය කරන්න බැහැ" ඔහු වචනයෙන් කීවේ එපමණකි. ඔහුගේ බැල්මෙන් තව යමක් කියැවිණි. එය නම් තම විචාරය කේන්ද්‍රගත වන්නේ නිර්මාණයට මිස මිත්‍රත්වයට නොවන බවයි.

කෘතියක් ඇගයීමේ දී නිර්මාණයෙන් බිහිවන ප්‍රවණතාවලට මුල් තැන දිය යුතු බව පවසන තවත් තරුණ විචාරකයකු ගැන ද මෙහිදී සඳහන් කළ යුතුය. ඔහු ආචාර්ය ලියනගේ අමරකීර්තිය. ඔහු යථාර්ථතල නම් වූ නව සංකල්පයක් ගෙන හැර පාමින් සමර්ථනය කරන්නේ ද කුමාරසිංහ විද්වතාගේ මතයම ය. කෘතියේ පැනෙන යථාර්ථය හඳුනාගෙන ඒ ඔස්සේ විචාරය කළ යුතු බව අමරකීර්ති පවසයි. සුමිත්‍රා රාහුබද්ධගේ සම්මානලාභී නවකථාවක් වන **කන්දක් සේ මා** කෘතියට එල්ල වන කැට කැබිලිතිවලට පලිහක් සකසමින් ඔහු පැවසූ අදහස් කුමාරසිංහ විද්වතාගේ අදහස් හා සමානය. ගම්ලත් ආදීන් 'කන්දක් සේ මා' විවේචනය කළේ එය අවර ගණයේ බසකින් ලියුවුණක් බව කියමිනි. අමරකීර්තිගේ ප්‍රතිතර්කය වන්නේ රාහුබද්ධ මැවූ නූපාගේ යථාර්ථ තලය ගම්ලත්ගේ විදග්ධ භාෂා යථාර්ථ තලයෙන් වෙනස් බවයි. මා දන්නා තරමින් කුමාරසිංහ පඬිවරයා රාහුබද්ධගේ "කන්දක් සේ මා" විචාරය කළේ නැත. ඔහු ඒ පිළිබඳ යම් මතයක් ඉදිරිපත් කොට තිබුණා නම් සන්දන්දනාත්මක (යථාර්ථතල හා) වැඩිපුර අදහසක් පළ කළ හැකිව තිබිණි.

කෙසේ වෙතත් දශක කීපයක් තිස්සේ ඔහු විසින් ලියා පළ කරන ලද විචාර විශාල ප්‍රමාණයක් මම පරිහරණය කළෙමි. ඒ ලිපි ඔහුගේ අදීන චින්තනයටත් සුනිශිත බුද්ධියටත් සාක්ෂි සපයයි. අයි. ඒ. රිචර්ඩ්ස්



1924 දී Principles of Literary Criticism කෘතියෙන් විචාරකයකුගේ සුදුසුකම් දක්වා තිබුණේ මෙසේ ය.

"හොඳ විචාරකයකු විධි විරෝධතාවෙන් තොරව තමන් විභාග කරන කෘතියට අදාළ චිත්ත ස්වභාවය වින්දනය කිරීමේ නිපුණයකු විය යුතුය."

විධි විරෝධතාවෙන් තොර වීමේ ගුණය හා විරෝධාත්මක මත ඉවසීමේ ගුණය කුමාරසිංහ තුළ ඉහළින් ම පවතී. මේ සංයමය හා ශික්ෂණය ඔහුට උරුම වූවේ කැලණිය සරසවියේ සිංහල අධ්‍යයන අංශයෙන් විය යුතු යැයි මට සිතේ.

### ආශ්‍රිත ග්‍රන්ථ


1. Richards I.A - Principles of Literary Criticism.
2. සංස්කෘතිය හා සාහිත්‍ය විචාරය - මනෝජ් ප්‍රසන්න රත්නායක (2009) - ගොඩගේ ප්‍රකාශන.
3. පශ්චාත් නූතනවාදය හා සාහිත්‍ය විචාර විමර්ශන - කුලතිලක කුමාරසිංහ.
4. සිළුමිණ - 2000 ජූනි 25 ද.